# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2297/49 - 2022 සැප්තැම්බර් මස 14 වැනි බදාදා - 2022.09.14

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*මගේ අංකය: 6/3/1/509/111.*
*ඉ. අ. යොමු අංකය: 4-3/6/2018/ HW/380.*

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම ලබා ගැනීමට රජය අදහස් කරන බැව්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබාගැනීමට බලාපොරොත්තුවන ඉඩමේ විස්තර* :

බස්නාහිර පළාතේ, කළුතර දිස්ත්‍රික්කයේ, හොරණ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අංක 613සී තලගල නැගෙනහිර ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ තලගල ගමේ පිහිටි, සර්වේයර් ජනරාල් වෙනුවෙන් කළුතර දිස්ත්‍රික් ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරි විසින් පිළියෙල කරන ලද මූලික පිඹුරු අංකය ක 4868 හා 2022.06.15 දිනැති පිඹුරේ කැබලි අංක 1 වශයෙන් පෙන්නුම් කර ඇති මුළු බිම් ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.0139 ක් වූ පහත සඳහන් ඉඩම් කොටස (01) :

**කැබලි අංකය 01**

ඉඩමේ නම: බෙරුකැටියදෙනිය සහ පොල්වත්තහේන; ඉඩමේ විස්තරය : විවෘත මුඩුබිම; හිමිකම් කියන අය : රජය; මුල් හිමිකම් පාන්නා: ඩී. එස්. ජේ. එදිරිසිංහ, අංක. 298, කොට්ටාව පාර, මොරගහහේන, මිල්ලෑව, (අත්කර ගැනීමේ කටයුතු අවසන් කිරීම සඳහා) ප්‍රමාණය: හෙක්: 0.0139.

ඉහත සඳහන් ඉඩමට/ පරවශතාවයට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගේ ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2022 ඔක්තෝබර් මස 03 වැනි දින පෙ.ව. 10.00 ට හොරණ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතු ය.

තව ද, 2022 සැප්තැම්බර් මස 26 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම/ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයන් එකී ඉඩම/ පරවශතාවයට ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ ආකාරයත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම්දිය යුතුයි.

ප්‍රාදේශීය ලේකම්,
හොරණ.

2022 අගෝස්තු මස 31 වැනි දින,
හොරණ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

EOG 09-0143



*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

## ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*මගේ අංකය: KES/DS/LND/AC/8/5/17.*
*ඉඩම් අමාත්‍යාංශයේ යොමු අංකය: 4-3/6/2018/ HW/408.*

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම ලබා ගැනීමට රජය අදහස් කරන බැව්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබාගැනීමට බලාපොරොත්තුවන ඉඩමේ විස්තර* :

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, කැස්බෑව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අංක 581ඒ, ඇරැව්වල බටහිර ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ ඇරැව්වල ගමේ පිහිටි, සර්වේයර් ජනරාල් වෙනුවෙන් කොළඹ දිස්ත්‍රික් ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරි විසින් පිළියෙල කරන ලද මූලික පිඹුරු අංකය කො9988 හා 2022.03.29 දිනැති පිඹුරේ කැබලි අංක 1 සිට 2 දක්වා පෙන්නුම් කර ඇති මුළු බිම් ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.0022 ක් වූ පහත සඳහන් ඉඩම් කොටස් (02) :

01. **කැබලි අංකය** 1
ඉඩමේ නම: වරි. අංකය 1449 සහ 1451, මහරගම පාර; ඉඩමේ විස්තරය : ගෙවත්ත; හිමිකම් කියන අය : රජය; මුල් හිමිකම් පාන්නා: ජී. ඩී. සීතා රංජනී රණසිංහ, අංක 619/1, එගොඩවත්ත, ඇරැව්වල, පන්නිපිටිය, (අත්කර ගැනීමේ කටයුතු අවසන් කිරීම සඳහා) ප්‍රමාණය: හෙක්: 0.0009.

02. **කැබලි අංකය** 2
ඉඩමේ නම: වරි. අංකය 4918 සහ 4919, මහරගම පාර; ඉඩමේ විස්තරය : ගෙවත්ත, ස්ථිර ගොඩනැගිල්ලක කොටසක් ඇත; හිමිකම් කියන අය : රජය; මුල් හිමිකම් පාන්නා: ජී. ඩී. පියදාස, අංක 620/3, එගොඩවත්ත, ඇරැව්වල, පන්නිපිටිය, (අත්කර ගැනීමේ කටයුතු අවසන් කිරීම සඳහා) ප්‍රමාණය: හෙක්: 0.0013.

ඉහත සඳහන් ඉඩමට/පරවශතාවයට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගේ ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2022 ඔක්තෝබර් මස 20 වැනි දින අනුව පෙ.ව. 10.00 ට කැස්බෑව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතු ය.

තව ද, 2022 ඔක්තෝබර් මස 13 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම/ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයන් එකී ඉඩම/ පරවශතාවයට ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ ආකාරයත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම්දිය යුතුයි.

**කේ. පී. පේමදාස,**
ප්‍රාදේශීය ලේකම්,
කැස්බෑව.

2022 සැප්තැම්බර් මස 05 වැනි දින,
කැස්බෑව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

EOG 09-0144